**ශීර්ෂය 017 - පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| | (a) මුදල් රෙගුලාසි 201(3)(අ) | 17,500 | දෛනික පදනමට වැටුප් ගෙවීම්වලදී එක් එක් පුද්ගලයාට වැටුප් ගෙවිය යුතු දින සංඛ්‍යාව සහතික කරන ලද ප්‍රකාශයක්, සහතික කිරීමේ නිලධාරියා විසින් අනුමත කිරීමේ නිලධාරියාගෙන් ලබා ගත යුතු වුවත්, වැටුප් වවුචර් පත් 02 ක් සඳහා එලෙස දින ගණන සහතික කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍රයෙන් ලබාගන්නා මුද්‍රිත සටහන් උපයෝගී කරගෙන වැටුප් ගෙවනු ලබන අතර ඒ ඇසුරෙන් සකස් කරනු ලබන ආකෘතිය අතපසුවීමකින් සහතික කිරීම මඟහැරී ඇති අතර, එය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (b) | මුදල් රෙගුලාසි 262 (2) | 99,400 | ගෙවන ලද සියලුම වවුචර්වල හා ඒවා තහවුරු කෙරෙන ලියවිලිවල “ගෙවන ලදි” මුද්‍රාව යෙදිය යුතු වුවත් , කාර්යාලීය සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීමට ලබාගත් අත්තිකාරම් පියවීම් වවුචරයේ හා අදාල තහවුරු ලියවිලිවල “ගෙවන ලදි” මුද්‍රාව තබා නොතිබුණි. | ඉන්ධන සැපයීමට ලබාගත් අත්තිකාරම් පියවීමට අදාළ වවුචරයේ “ගෙවන ලදී” මුද්‍රාව අතපසුවීමකින් තැබීමට නොහැකිව ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ii)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වා දීමට අදාල මාර්ගෝපදේශයේ 1.2 ඡේදය | | පුරවැසි ප්‍රඥප්තිය ආයතනගත කිරීමේ දී සැලකිය යුතු මුලධර්මයක් ලෙස මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික විය යුතු වුවත්, කාර්යාලීය වෙබ් අඩවියේ පවත්වා ගෙන යනු ලබන එක් එක් ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සභාගත කිරීම් සම්බන්ධයෙන් දක්වා තිබූ තොරතුරු නිවැරදි නොවීය. | කාර්යාලීය වෙබ් අඩවියේ අදාළ තොරතුරු නිවැරදි කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iii)** | **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | | | | |
| | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.7 ඡේදය | | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන පිළියෙල කළ යුතු වුවත්, ආයතනය විසින් | කාර්යාලය ‘ බී’ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන බැවින් ගිණුම් තැබීමේ ක්‍රියාවලියේදී | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිලියෙල |

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හරස් සටහන් මගින් කිරීමට කටයුතු පිලියෙල කිරීමේ දී හරස් ගිණුම් තැබීමක් සිදු කළ යුතුය. සටහන් සැලකිල්ලට කරනු නොලබයි. ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයන්හි පස්වරු 5.30 න් පසුව සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනාවලට අදාල වවුචර්පත්වල පිටවීම් තහවුරු කිරීමේ ලේඛන නොමැතිව නිලධාරීන් 38 දෙනෙකුට රු.104,250 ක් ගෙවා තිබුණි. | පාර්ලිමේන්තු රැස්වීම් දිනවල ප.ව. 5.30 න් පසුව පිටවීම තහවුරු කිරීම්වලට අදාළ ලේඛන අතපසුවීමකින් ගොනුවට අමුණා නොතිබූ අතර එම ලේඛන මේ වන විට ගොනුවට අමුණා ඇත. | ගෙවීම් කිරීමේ දී අදාළ ලේඛන මඟින් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වූ 2023 ජූලි 01 වන සෙනසුරාදා දින සේවය කිරීම වෙනුවෙන් 1/20 දීමනාව සඳහා ඇඟිලි සලකුණු මුද්‍රිත සටහන නිවැරදි බව පරීක්ෂා කර, සහතික කිරීමකින් තොරව රු.65,915 ක් නිලධාරීන් 33 දෙනෙකුට ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | 1/20 දීමනාව ගෙවීමේදී ඇඟිලි සලකුණු මුද්‍රිත සටහන මඟින් පැමිණීම සහ වැඩ කළ කාලය තහවුරු කර ගෙන ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ ඉතා සීමිත කාර්ය මණ්ඩලක් සිටින බැවින් මාගේ සෘජු අධීක්ෂණයෙන් ඵලදායි ක්‍රමවේදයක් යටතේ පවත්වාගෙන යනුලබන බැවින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබන බව සහතික විය හැක. | ජාතික විගණන පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |